09672

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II | | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I, II | | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I, II | | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40**ක් ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** සිරිපාල **දෙලොවක් අතර අතරමං වී** සිටියේ ය.
(1) ලෝක දෙකක් අතර අතරමං වී
(2) නිශ්චිත නිගමනයකට පැමිණීමට නොහැකි ප්‍රශ්නයකට මැදි වී
(3) පහසුවෙන් විසඳාගත හැකි ප්‍රශ්නයකට මුහුණ දී
(4) දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයකට මැදි වී

**2.** **භාණමිටි අදහස්** දරන්නන්ගෙන් සමාජයට වන යහපතක් නැත.
(1) කාලයට නොගැළපෙන අදහස්
(2) සියල්ලන්ගේ එකඟතාවක් නැති අදහස්
(3) මෝඩයන් දක්වන අදහස්
(4) යම් අවස්ථාවක මතු වන විකල්ප අදහස්

**3.** ඔහු **තෙලෙන් කා කිරෙන් අත සෝදන්නෙකි.**
(1) තමන් සතු සම්පත් විනාශ කර ගන්නෙකි.
(2) පස්ගෝරසවලින් අඩුවක් නොමැති අයෙකි.
(3) ධාන්‍යාදියෙන් අඩුවක් නැති පුද්ගලයෙකි.
(4) සියලු සැප සම්පතින් ආඪ්‍ය වූවෙකි.

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** විචාරකයාගේ කර්කශ වචන හමුවේ රචකයා .............................. වූයේ ය.
(1) සම්මුඛ (2) දුර්මුඛ (3) ප්‍රමුඛ (4) අභිමුඛ

**5.** ඥාතිත්වය අනුව අමල් නිමල්ගේ වැඩිමහල් සහෝදරයෙකි. එබැවින් අමල් නිමල්ට වඩා .............................. ය.
(1) ශ්‍රේෂ්ඨතර (2) වෘද්ධතර (3) සුන්දරතර (4) ප්‍රවීණතර

**6.** එකඟතාවකට පැමිණි දෙපාර්ශ්වය විසින් අස්සන් කරන ලද්දේ .............................. ගිවිසුමකි.
(1) අවහිරතා (2) සංකුලතා (3) අනුකූලතා (4) අවබෝධතා

[දෙවැනි පිටුව බලන්න.

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ගොලුබෙල්ලා, යථාර්ථය, වෙරළ, හැලිය (2) කනාටු, කිකිණි, ගෘහස්ත, ජනාකීර්ණ
(3) පිළිරුව, රුධිරාණු, වළලු, විභීෂණ (4) දුෂ්ඨ, රණකෙළි, වෙලඹ, සමථකරණය

8. වාරණ, දීන, මුල්ල, කෑම යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇදපිල්ල
(2) ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල
(3) දීර්ඝ ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
(4) ඇලපිල්ල, දීර්ඝ ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල

9. 'පන්තිය' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) දන්තජ, මූර්ධජ හා ඕෂ්ඨජ ය. (2) ඕෂ්ඨජ, මූර්ධජ හා කණ්ඨජ ය.
(3) කණ්ඨජ, දන්තජ හා ඕෂ්ඨජ ය. (4) ඕෂ්ඨජ, දන්තජ හා තාලුජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) ජයතිලක, නවගත්තේගම, වික්‍රමසිංහ, සේනානායක
(2) ගුණසේකර, ගුනසිංහ, කම්මැල්ලවීර, සුරවීර
(3) කුමාරසිංහ, ජයකොඩි, සරච්චන්ද්‍ර, නන්දිමිත්‍ර
(4) කරුණාසේන, දයාසේන, කරුණාරත්න, සුනේත්‍රා

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) නාගරිකයෙක්, ව්‍යාපාරිකයන්, අධිපතියෙක්, මෙහෙසියක
(2) වනචාරියකු, වැද්දෙක්, පූජකයකු, ඇමතියෙක්
(3) ඌරකු, වැඳිරියක, අංගනාවන්, අහිංසකයකු
(4) ලේඛිකාවක්, ධනවතියක, බලවත්තු, මෝඩයන්

12. 'සංචාරකයා ඔරුවෙන් ගඟ තරණය කළේ ය' යන වාක්‍යයෙහි '**ඔරුවෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) කරණ (2) අවධි (3) සම්බන්ධ (4) කර්ම

13. 'දසදෙස' යන්න අයත් වන්නේ,
(1) විභක්ති සමාසයට ය. (2) විශේෂණ සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය. (4) අව්‍යය සමාසයට ය.

14. 'වේද + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක්වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) වෛදික (2) වේදයික (3) වේදික (4) වෛවේදික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) නිපාත - මෙන්, සේ, වැනි, බඳු
(2) තද්ධිත - මුත්තණු, මලණු, බෑනණු, පුතණු
(3) මිශ්‍ර ක්‍රියා - සිනාසිසී, තරමින්, යමින්, බාමින්
(4) පර රූප සන්ධිය - ගොක්කොළ, හද්දවස, අස්සන, ලිබ්බොක්ක

16. **ප්‍රයෝජ්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) ඉන්ද්‍රජාලිකයා සිත්තමක් මවයි. (2) සංවිධායකයා අසුන් පනවයි.
(3) බලවතා දුබලයාට රවයි. (4) අභිකුණ්ඨිකයා රිළවකු නටවයි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. දේශකයා තම අදහස **අවධාරණය** කළේ ය.
(1) දැඩි ව ප්‍රකාශ කිරීම (2) අර්ථ විග්‍රහ සහිත ව ප්‍රකාශ කිරීම
(3) විධිමත් ව ප්‍රකාශ කිරීම (4) තර්කානුකූල ව ප්‍රකාශ කිරීම

18. විදුහල්පතිතුමා ආචාර්ය මණ්ඩලයට **නොවක්** සිතින් ස්තුතිය පිරිනැමී ය.
(1) වංක (2) වංචනික (3) අවංක (4) සංවේදී

**19.** ඒ බුද්ධිමතා **අනතිමානී** ගුණයෙන් යුක්ත ය.
(1) අධික වූ මාන්නයෙන් යුතු (2) අධික වූ මාන්නයෙන් තොර
(3) මාන්නයෙන් තොර (4) නිරහංකාර

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) කෝණමානය, කවකටුව, අඩිරූල, දුරේක්ෂය
(2) නවකතාව, කෙටිකතාව, කාව්‍ය සංග්‍රහය, නාට්‍ය පිටපත
(3) සරම, කලිසම, කමිසය, තොප්පිය
(4) ඉදිකටුව, නූල්බෝලය, රෙද්ද, කතුර

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | චක්‍රය - රෝදය, | වනය - උද්‍යානය, | තෘණ - තණ, | රශ්මි - රැස් |
| (2) | දොර - ද්වාර, | වත - වස්ත්‍රය, | මංගල - මඟුල, | ගිරි - කන්ද |
| (3) | විමාන - විමන, | ගුහාව - ලෙන, | බාහුව - උර, | මැණික් - මිණි |
| (4) | වෛරය - තරහ, | ආහාර - බත්, | සන්දේශය - පණිවුඩය, | රට - දේශය |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගෙය - ගෘහය, නිවස, නිවාසය, ශාලාව (2) අනංගයා - මල්සරා, මල්හී, අනඟ, මින්දද
(3) ලෝකය - ජගත්, ලොව, දිය, ලෝ (4) අම්මා - මව, මාතෘ, ජනනී, මාතා

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) කාර්ය - අකාර්ය (2) සාවද්‍ය - නිරවද්‍ය
(3) ඥාති - මිත්‍ර (4) සුගුණ - දුගුණ

**24.** වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) වර්ගාන්තාක්ෂර හා සඤ්ඤකාක්ෂර සමාන ය.
(2) 'විකුමැති' යනු ස්වර සන්ධි පදයකි.
(3) 'සගසිරි අසාලා' මෙහි 'අසාලා' යනු පූර්ව ක්‍රියා පදයකි.
(4) 'ලියන' යනු වර්තමාන කෘදන්ත පදයකි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) නගර සභාවෙහි මුඛ්‍ය කාර්යය කුණු ඉවත් කිරීම පිණිස ය.
(2) නිදහස් අදහස් ජනිත කිරීම ස්වාධීන දේශයක් පමණි.
(3) බොහෝ තරුණ තරුණියන් රට හැර යනු දක්නට ලැබේ.
(4) ගිරි දුර්ගය පසු කිරීමට පල්ලමක් බැසිය යුතු ම ය.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** යමක් අවිනිශ්චිත ස්වරූපයෙන් පැවතීම
(1) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ.
(2) දත් තිස් දෙකට හිර වූ දිව වගේ.
(3) මඩේ හිටවපු ඉන්න වගේ.
(4) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්න වගේ.

**27.** පිටින් පෙනෙන දේට වඩා සම්පූර්ණයෙන් වෙනස් දෙයක් අභ්‍යන්තරයේ වීම
(1) උදේ පටන් වතුර ඇදල හැන්දෑවට කළේ බින්දා වගේ.
(2) ගලෙන් පට්ටයක් ගන්නා වගේ.
(3) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ.
(4) හක්කෙ බුදුරැස් බොක්කෙ දඩමස් තිබෙන්නා වගේ.

**28.** ආගම සන්ධියට හා ස්වරාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) මහෝපකාර, නිරවුල් (2) නිරවුල්, පන්තිස්
(3) නිරවුල්, මහෝපකාර (4) පන්තිස්, මහෝපකාර

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) දරුවනි, වඳුරන් සේ කෑම සඟවා ගෙන නො කව.
(2) අසුරයෝ හා සුරයන් ගැටෙති.
(3) ලේඛකයා කවිකයෙක් ද විචාරකයෙක් ද වෙති.
(4) රටට, ජනතාවට හිතැති යහපත් පාලකයෙක් පහළ වේවා!

**30.** (1) අසරණයෝ අභාග්‍යවන්තයන් වූ.
(2) කායික රෝග විශේෂඥයෝ මානසික රෝග විශේෂඥයෝ නො වෙති.
(3) මැතිවරණයේ දී ඡන්දදායකයෝ නිවැරදි තීරණයක් ගනිති.
(4) ඇතැම් මිනිස්සු වංචනික ක්‍රියාවල නිරතවන්නේ ඇයි?

**31.** ● තේ හැන්දෙන් එකක් .............................. උදයට බොන්න.
● ඈ ගැබිනියක .............................. රඟපෑවා ය.
● ජලගැල්ම .............................. කුඹුරු විනාශ විය.
● දේශය ගොඩ නැගීම .............................. දායක වන්න.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පමණ, මෙන්, නිසා, සඳහා
(2) පමණ, නිසා, මෙන්, සඳහා
(3) පමණ, සඳහා, නිසා, මෙන්
(4) පමණ, නිසා, සඳහා, මෙන්

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං නැති අල්ල පනල්ලෙ හොරෙක් ගෙට රිංගලා"

(1) මා ගෙදර සිටින අවස්ථාවේ ම සොරකු ගෙදරට පැමිණ ඇත.
(2) මා අසල නිවසට ගිය අවස්ථාවේ සොරකු ගෙදරට පැමිණ ඇත.
(3) මා සොරා අල්ලා ගැනීමට උත්සාහ කරද්දී ඔහු ගෙදරට ඇතුළු වී ඇත.
(4) මා නොමැති අවස්ථාවක සොරකු ගෙදරට පැමිණ ඇත.

**33.** ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) සියලු ම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් නොමිලයේ ලබා දීම
(2) ග්‍රාමීය පාසල් රාශියක් බිහි කිරීම
(3) ශාස්ත්‍රීය හා වෘත්තීය විෂයධාරාවලින් යුත් මධ්‍ය විද්‍යාල රැසක් පිහිටුවීම
(4) ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කිරීම

**34.** වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
දහදිය නොම සැලෙන ගතේ
ඔබ පොළවට බරකි පුතේ

යන පද්‍යයේ අදහස නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ශරීර ශක්තියෙන් හා මුහුණේ පැහැපත් බවින් යුතු ව මහපොළොවට බරක් නොවී රට වෙනුවෙන් ශ්‍රම දායකත්වය ලබාදිය යුතු බව
(2) ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව තිබුණ ද රට වෙනුවෙන් ශ්‍රම දායකත්වයක් සපයන්නේ නැති නම් ඔහුගෙන් පලක් නැති බව
(3) රට වෙනුවෙන් ශ්‍රමය වැය කිරීම අනිවාර්යයෙන් කළ යුතු වුවත් ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව රැක ගත යුතු බව
(4) මහපොළොවට බරක් වන්නේ ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව රැක ගනිමින් ශ්‍රම දායකත්වය සැපයීම නොකළ විට බව

**35.** හුණුවටයේ කතාව නාට්‍යයේ ඇතුළත්,

"අප්ප උඹේ හොර දෙටු වා
අම්ම හරිම කුනකටුවා
ඒ හින්දා පුතේ උඹට
මුළු ලෝකෙ ම දණ නමාවි"

යන ගීය කියන්නේ,

(1) ග්‍රෑෂා ය. (2) නටාලියා ය. (3) සයිමන් ය. (4) අසඩක් ය.

**36.** "වැහි වලාකුළ පැ කළු යයි මබේ
නො හොබිති' යි කිසි ලෙස් නො සතොස් නොවන්
සිරුර පැයෙනු ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා"

යන පද්‍ය කොටස ද ඇතුළත් වැහි වලාකුළ පද්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

(1) සිරි ගුනසිංහ ය. (2) කුමාරතුංග මුනිදාස ය.
(3) ගුණදාස අමරසේකර ය. (4) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ ය.

**37.** භාෂාව සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) භාෂාව මානවයාගේ නිෂ්පාදනයකි.
(2) ලෝකයේ පවතින භාෂා සංඛ්‍යාව නිශ්චිත ව කිව නොහැකි ය.
(3) භාෂාව කායික ව ලැබෙන දෙයක් නොවන අතර එය ලබා ගන්නේ පරිසරයෙනි.
(4) භාෂාව හා සංස්කෘතිය අතර සම්බන්ධතාවක් නොමැත.

**38.** පයින් ගොයම් පාගන විට එළන පැදුර කමත් භාෂාවේ දී හඳුන්වන නම කුමක් ද?

(1) මාගල (2) කුවාලම (3) යතුර (4) බාන

**39.** 'ප්‍රාචීන භාෂා පිළිබඳ වත් ප්‍රතිචීන භාෂා පිළිබඳ වත් බලංගොඩ නාහිමියන් සතු ව පැවති ප්‍රවීණත්වය අතිමහත් ය.' මෙහි ප්‍රාචීන භාෂා යනු,

(1) සංඥා භාෂා ය. (2) අපරදිග භාෂා ය.
(3) චීන භාෂා ය. (4) පෙරදිග භාෂා ය.

**40.** පහත දැක්වෙන ප්‍රකාශයේ අදහස වඩාත් ම නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"කවියෙකු හැටියට ශේක්ෂ්පියර්ගේ පතළ කීර්තිය ඔහුගේ විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ තුදුස් පද සැහැලිවලින් පළ වන නමුදු එකී අපූර්ව කවීත්වය වඩාත් ම ප්‍රකාශයට පත්වන්නේ ඔහුගේ නාට්‍ය නිර්මාණයන්හි අන්තර්ගත පද්‍ය නිර්මාණවලිනි."

(1) විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ සැහැලිවලින්, කවියෙකු ලෙස ශේක්ෂ්පියර්ගේ කීර්තිය පැතිරුණ ද ඔහුගේ කවීත්වය වඩාත් ප්‍රකට වන්නේ නාට්‍ය නිර්මාණවල ඇතුළත් පද්‍ය නිර්මාණවලිනි.
(2) ශේක්ෂ්පියර් කවියකු වන අතර ඔහුගේ කීර්තිය ප්‍රකට වී ඇත්තේ විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ තුදුස් පද සැහැලිවලින් පමණක් නොවන අතර නාට්‍යවල ඇතුළත් පද්‍ය නිර්මාණ ද ඊට හේතුපාදක වී ඇත.
(3) ශේක්ෂ්පියර් කවියකු ලෙස ඉමහත් කීර්තියක් අත්කර ගැනීමට විවිධ කාව්‍ය නිර්මාණ සහ තුදුස් පද සැහැලි ද හේතු වී ඇති අතර ඔහුගේ කවීත්වය වඩාත් ඉස්මතු වන්නේ නාට්‍යවල ඇතුළත් පද්‍ය නිර්මාණවලිනි.
(4) විවිධ කාව්‍ය නිර්මාණ සහ තුදුස් පද සැහැලිවලින් කවියෙකු ලෙස ශේක්ෂ්පියර් කීර්තියක් අත්කර ගත්ත ද නාට්‍ය නිර්මාණවල ඇතුළත් පද්‍ය නිර්මාණවලින් ඔහුගේ කවීත්වය ප්‍රකට ව පෙනේ.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්
(අ) සඤ්ඤක අක්ෂරයක් ලියා දක්වන්න.
(ආ) අන්තඃස්ථාක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"එම සිද්දිය පිළිබඳ තොරතුරු ගවේෂණය කළ විමර්ශන නිළධාරිහු එකී තොරතුරු අධිකරණය වෙත වාර්තා කළහ."

(iii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) කීර්තිය (ආ) සුසිරිත

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.
(අ) තනි ව හැසිරෙන (ආ) සමාන හදවතක් ඇති

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පද **දෙක** ලියන්න.
"උපසභාපතිතුමා කළ ප්‍රකාශය නිවැරදි නොවන බව පැමිණ සිටි සාමාජිකයන්ගෙන් බහුතරයක් දෙනා එක හඬින් ප්‍රකාශ කළහ."

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) සිංහයෝ මෙන් සැරසුණු දරුවෝ ජාතික ධජ ඔසවමින් ක්‍රීඩකයන් පිළිගැන්වූහ.
(ආ) සාහිත්‍ය සංගමයේ සාමාජිකයෝ හෙවත් සිසුන් විවිධ නිර්මාණ ඉදිරිපත් කළහ.

(vii) 'මහා මාර්ගවල ගමනාගමනයේ යෙදෙන ඇතැම් රියැදුරන් සිත්පිත් නැත්තන් සේ ක්‍රියා කිරීම රිය අනතුරුවලට ප්‍රධාන හේතුවකි' යන වාක්‍යයේ ඇතුළත් යුගල පදයක් හා විශේෂණ පදයක් ලියන්න.

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.
(අ) චන්ද්‍ර මඬල (ආ) සොබා ධර්මය

(ix) පහත සඳහන් වාක්‍යවල ඇති තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා ප්‍රවර්ගයට අයත් වේ ද?
(අ) නොනැවති ඉදිරියට ම **යවු**.
(ආ) හිරු **බසිත** කෙමෙන් කෙමෙන් සඳ අහසට නැගෙයි.

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) දේශප්‍රේමීන් විසින් දේශය ආරක්ෂා කරනු ලබයි.
(ආ) ගුරුවරුන් විසින් නිරන්තරයෙන් ශිෂ්‍යයෝ යහමගට යොමු කෙරෙති.

(ලකුණු 02 × 10 = 20 යි)

[හත්වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) සුළු වර්ෂාවක දී පවා මෙරටෙහි ඇතැම් නගර ජලයෙන් පිරීයනු නිබඳ ව දැකිය හැකි ය. එම නිසා නාගරික ජනතාවට ආපදා රැසකට මුහුණ දීමට සිදු වී ඇති අතර ඒවා එදිනෙදා ජන ජීවිතයට ද අහිතකර ලෙස බල පා ඇත. පරිසර හිතකාමී යහපත් මානව චර්යා හැඩගස්වා ගැනීම සහ විධිමත් නගර සැලසුම්කරණය මඟින් මෙම ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීම උචිත ය. ඒ වෙනුවෙන් අදාළ වගකිව යුතු ආයතනවල සහ පුද්ගලයන්ගේ අවධානය හා සක්‍රිය දායකත්වය ද නොමඳ ව ලැබිය යුතු ය.

(ආ) වයස් භේදයකින් තොරව වර්තමානය වන විට බොහෝ දෙනා 'සමාජ මාධ්‍ය' ඇසුරු කරති. නිවැරදි තොරතුරු හුවමාරු කර ගැනීම, දැනුම ලබා ගැනීම, එකිනෙකා අතර යහපත් සම්බන්ධතා ඇති කර ගැනීම ආදි ප්‍රයෝජන රැසක් මෙමගින් ලබා ගත හැකි ය. එසේ වුවත් සමාජ මාධ්‍ය අවභාවිත කිරීම නිසා ඇතැම් විට පැන නැගෙන ගැටලු සමාජයට හිතකර නො වේ. එම නිසා සමාජ මාධ්‍ය භාවිතයේ දී පරිශීලකයන්ගේ 'ස්වයං නියාමනය' අත්‍යවශ්‍ය බව නිරතුරු ව අවධාරණය කෙරේ.

(ඉ) ලෝක පරිසර සංවිධානවල දැඩි අවධානයට ලක් වී ඇති 'ප්ලාස්ටික් අපද්‍රව්‍ය' සම්බන්ධ ගැටලුව, ශ්‍රී ලංකාවට ද ප්‍රබල තර්ජනයක් වී ඇත. අවිධිමත් ලෙස පරිසරය වෙත මුදා හැරෙන මේ අපද්‍රව්‍ය කඳු, බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ගැටලුවලට මූලික වී ඇත. එම ගැටලුවලට පිළියම් ලෙස පරිසර නීති බලාත්මක කිරීම, ප්ලාස්ටික් දූෂණයේ අහිතකර බලපෑම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වා දීම ආදි බොහෝ දෑ යෝජනා වී ඇත. මේ සඳහා පාසල් ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම ද වඩාත් සඵලදායක වනු ඇත.

(ඊ) උසස් නවකතා පරිශීලනයෙන් ජීවිතාවබෝධය සේ ම රසාස්වාදය ද පෘථුල වේ. ඒ සඳහා බොහෝ නිදර්ශන, දේශීය හා විදේශීය සාහිත්‍යය ඇසුරෙන් සපයා ගත හැකි ය. මෙරටෙහි වසරකට සිංහල නවකතා සියයකට අධික සංඛ්‍යාවක් පළවීමෙන් ප්‍රකට වනුයේ නවකතාව අත්පත් කරගෙන ඇති ජනප්‍රියත්වය යි. මේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂ ව සිංහල නවකතාවේ ගුණාත්මක පක්ෂය ද වර්ධනය විය යුතු බව විචාරක මතය යි.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ** කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සෑම ළමයෙකුට ම ඉගෙනීමට හැකි බවත් එක් එක් ළමයින් ඉගෙන ගන්නේ එක් එක් වේගයෙන් බවත් විවිධත්වයෙන් යුතු විවිධ අයට විවිධ සහාය අවශ්‍ය බවත් අධ්‍යාපන මනෝවිද්‍යාවේ පිළිගැනීම යි. ඒ නිසා ළමයින්ගේ ශාරීරික, බුද්ධිමය, සමාජීය, චිත්තවේගී, භාෂාමය හෝ වෙනත් තත්ත්ව නො සලකා ළමයින් සියලු දෙනාට ම සාමාන්‍ය පාසල්වල ඉගෙනීමට ඉඩපහසුකම් සැලසිය යුතු ය. දුබලතා සහිත ළමයින්, සුහග ළමයින්, නිවසක් නොමැති ළමයින්, දුෂ්කර හෝ ස්ථිර පදිංචි ස්ථානයක් නැති ජනයාගේ ළමයින් සහ වරප්‍රසාද අහිමි වී ඇති හෝ හුදෙකලා වී ඇති ප්‍රදේශවල හෝ කණ්ඩායම්වල ළමයින් මෙයට ඇතුළත් විය යුතු ය.

දුබලතා සහිත සෑම පුද්ගලයෙකුට ම තමාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තමාගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. ඉතා දිගු කලක සිට විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ හැකියාවට හා ඵලදායිතාවට වඩා ඔවුන්ගේ ඌනතාවට අවධානය යොමු කරන සමාජය, විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ප්‍රශ්න ව්‍යාකූල කර ඇත. එනිසා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ පාසල් වශයෙන් හඳුන්වා දෙන සාමාන්‍ය පාසල්වල අධ්‍යාපනය ලබා දීමේ දී පාසලට අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වේ. මේ සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීමට ළමයා කේන්ද්‍ර කර ගත් ඉගැන්වීමේ ක්‍රමයක් බිහි විය යුතු ය. එම පාසල මඟින් සෑම ළමයෙකුගේ ම විභව්‍යතා උපරිම මට්ටමට ගෙන එන, උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීමට සාදරයෙන් ඔවුනොවුන් පිළිගන්නා අන්තර්කරණ සමාජයක් බිහි විය යුතු ය. එවැනි ක්‍රමයක ඉගැන්වීමේ ක්‍රියාවලියේ වේගය හා ස්වභාවය විය යුත්තේ කලින් නියම කළ පිළිවෙළකට ළමයා යොදා ගැනීම නො වේ. ළමයාගේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම වෙනස් කිරීම යි.

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන උද්ධෘතය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

මිනිසා පරිපූර්ණත්වයට පත් කිරීම උදෙසා ඉවහල් වන 'කියවීම' යනු සංකීර්ණ ක්‍රියාවලියකි. මුද්‍රිත පෙළක ඇති වචන හඳුනා ගෙන එයින් කියවෙන අරුත අවබෝධ කර ගැනීම 'කියවීම' ලෙස සරල ව හැඳින්විය හැකි ය. වචන හඳුනා ගැනීම සහ අවබෝධය, කියවීමේ දී සිදු වන ක්‍රියාවලි දෙකකි. භාෂාත්මක සංකේත එහි ශබ්ද හා අනුරූප වන ආකාරය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය වචන හඳුනා ගැනීම ලෙස පැහැදිලි කළ හැකි ය. වචනවල හෝ වාක්‍යවල හෝ සබැඳි පෙළක හෝ අර්ථය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය අවබෝධය යි.

ළමයින්ගේ භාෂා කුසලතා සංවර්ධනය වයස අවුරුදු 2-7 කාලයේ දී සිදු වන බව අධ්‍යාපන මනෝවිද්‍යාඥයෝ පවසති. එබැවින් මුල් ළමාවියේ දී මෙන් ම ප්‍රාථමික අධ්‍යාපන අවධිය ආරම්භයේ දී දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුතු ය. එය සමබර පෞරුෂයකින් යුතු ස්වාධීන කියවන්නකු තැනීමේ අඩිතාලමක් ද වනු ඇත. දරුවන් පොතපතට හුරු කරවීමේ වගකීම දෙමාපියන්ට, ගුරුවරුන්ට මෙන් ම අධ්‍යාපන බලධාරීන්ට ද පැවරී ඇති සුවිශේෂ වගකීමකි.

ප්‍රාථමික පන්තිවල 'කියවීම් කාමර' ආදිය ස්ථාපිත කොට දරුවන් කියවීමේ ක්‍රියාකාරකම් විෂයෙහි යොමු කිරීම සඳහා ගුරුවරුන්ට මග පෙන්විය හැකි ය. ඒ ඒ ශ්‍රේණිවලට යෝග්‍ය වන සේ ළමා සාහිත්‍ය කෘති උපයෝගී කර ගනිමින් ශබ්ද නගා කියවීම, සහකියවීම, මගපෙන්වන ලද කියවීම, ස්වාධීන කියවීම ආදි ක්‍රියාකාරකම් රැසක් ද පාසලේ දී සිදු කළ හැකි ය.

නිසිකලට කියවීමේ කුසලතාව දියුණු කළ විට දරුවන්ට ලැබෙන ප්‍රයෝජන රාශියකි. වාංමාලාව පෝෂණය වීම, ලෝකය පිළිබඳ අවබෝධය පාථුල වීම, නිර්මාණශීලීත්වය දියුණු වීම, පරිකල්පනය තීව්‍ර වීම, සන්නිවේදන ශක්‍යතා වර්ධනය වීම ඉන් කිහිපයකි.

(i) මෙහි දැක්වෙන පරිදි අවබෝධය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ii) කියවීමේ දී සිදු වන ක්‍රියාවලි **දෙක** මොනවා ද?

(iii) දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුත්තේ කුමන අවධිවල දී ද?

(iv) දරුවන්ට කියවීම ප්‍රගුණ කරවීම සඳහා සිදු කළ හැකි ක්‍රියාකාරකම් **දෙකක්** නම් කරන්න.

(v) මෙම පාඨයේ සඳහන් වන පරිදි කියවීමේ කුසලතා දියුණු කිරීමෙන් අත් වන ප්‍රයෝජන **දෙකක්** නම් කරන්න.

(ලකුණු $02 \times 5 = 10$ යි)

**5.** ඔබ බිම්මල් වගා කරන්නකු යැයි සිතන්න. ඔබේ බිම්මල් ව්‍යාපාරය සහ බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා යෝග්‍ය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න. බිම්මල් ව්‍යාපාරය සඳහා නමක් ද යොදන්න.

**නැතහොත්**

ඔබේ පාසලේ පැවැත්වෙන අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වන මෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. කලා සංගමයේ ලේකම් උදිත සමරසිංහ ඔබ යැයි සිතන්න. අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සුදුසු නමක් ද යොදන්න

(ලකුණු 15 යි)

❊ ❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | III**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III | | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் III | | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature III | | *Two hours* |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **තොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවී රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ. හො?"

(අ) මේ ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?

(ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ii) නො දැන ම තමා බල
සබයට අවුත් නො පැකිළ
**වැද රද පද කමල**
දෙසෙක මුසිලයා ද උන් කල

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?

(ආ) මේ පද්‍යය උපුටා ගත් කෘතිය අයත් වන්නේ කවර අවධියකට ද?

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම

(අ) ..................................................

(ආ) ..................................................

(iv) "කුරක්කන් අඹරන්ඩ අය නැතුවට කන්ඩ අය නම් ඕනැ තරම් ඉන්නව. මටත් කරන්ඩ තිබුණෙ අර වී ඇටය අහුලපු කිකිළි කරපු දේ"

(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ කතුවරයා කවරෙක් ද?

(ආ) එම කතුවරයාගේ මුල් ම කෙටිකතා සංග්‍රහයේ නම කුමක් ද?

(v) "ඇයට තමා හා එකට ඉගෙන ගත් මිතුරියක් සිටියා ය. මිතුරිය බැලීමට ගොස් පෙරළා ආ සෑම විටෙක ම ඈ බලවත් චිත්ත සන්තාපයට හා දුක් වේදනාවකට භාජන වූවා ය."

(අ) මේ ප්‍රකාශය උපුටා ගෙන ඇති නිර්මාණයේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් තැනැත්තිය චිත්ත සන්තාපයට පත්වීමට හේතුව කුමක් ද?

(vi) (අ) 'අමාවතුර' කෘතිය රචනා කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක් පාදක කර ගෙන ද?

(ආ) මේ කෘතිය රචනා වූ කාලය ලෙස පිළිගැනෙන්නේ කුමන අවධිය ද?

(vii) කුළින් කුළම සිහිල්'ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තලින් තළම පුල් පියුමු'පුල පඬුරුය

(අ) ඉහත සඳහන් කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථයේ නම කුමක් ද?

(ආ) සිතල ජලය යන්න සඳහා ඉහත කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

(viii) සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි - නොනවතිමි

(අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.

(ආ) පද්‍ය පාද දෙකෙන් මතු කෙරෙන ශබ්දාලංකාරය කුමක් ද?

(ix) "මේ ගම දැන් හොල්මන් අධිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි. ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි."

(අ) මේ ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?

(ආ) මේ පාඨය උපුටා ගත් කෘතියේ නම කුමක් ද?

(x) එල්ල වෙන්ට කවි කර කිවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමග එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

(අ) මේ පද්‍යය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මේ පද්‍යය අයත් වන්නේ කුමන කාව්‍ය වර්ගයකට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **පටත්** සුරිඳු දුන් උපදෙස් සිහි කොට
**ඉටත්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
තුටත් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) මුළු පද්‍යයේ ම අදහස සරල බසින් ලියන්න.

(ii) "දර පලා සඳහා **වල් යන්නාහු** නැති. ඊ ගමට වැදැ පයින් පැහැරැ දොර ගලවා-පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැගෙන-යෙයි. එ කල්හි ගම්වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්හා. නියම්ගම්වැස්සො ගොස් නුවර වන්නු. තුන් යොජනක් තන්හි මිනිස්නු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ **රාජාඞ්ගණයෙහි** රැස් වැ "මහරජ, තා ගෙ රට අඞ්ගුලිමාල නම් සොරෙක් වි යැ" කිය කියා වලපිත්."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) අඟුල්මල් නිසා බියට පත් ජනතාව හැසුරුණු ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii) **දිමුත්** වෙහෙර වට විසිතුරු මල් වතු ය
එහිත් පුවඳ මල් නිති වෙයි මිණි මුතු ය
**මහත් තුරු** මියුරු පල ගෙන නැමී අතු ය
රැගත් සෙවණ නො හැරම සිටි පොල් වතු ය

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කවියා, විහාරය ආශ්‍රිත පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කර ඇති අයුරු කෙටියෙන් ලියන්න.

(iv) නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
සුපුල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙළ
එකල් කෙළන වන දෙව් ලිය දැක කොමළ
ළසල් රුකෙක සැතපෙව ළපටු සිහලැ'ළ

(අ) මේ පද්‍යයේ අන්තර්ගත උපමාව සහ උපමේය වෙන් කොට දක්වන්න.

(ආ) කවියා සැළලිහිණියාට විවේක ගන්නට යැයි පවසන්නේ කුමන දේවල් නැරඹීමෙන් අනතුරු ව ද?

[තුන්වැනි පිටුව බලන්න.

(v) "ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු වතෙක් ඇත්තේ ය. ඉදින් කිසි තෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේගේ **දසරුවට** බස්නාහ; ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් **ඇකයෙහි** ගොස් හිඳිනාහ; ඉදින් බොහෝ දෙනා ඇසුව මනා වී නම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන් වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන්, 'රහසැ **බිණිය** යුතු යැ' යි අමරා දේවීන් හා බොහෝ දෙන ඉවත් ව ගියහ."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) හස්නක් ප්‍රකාශ කිරීමේ දී ගිරා පණ්ඩිතයන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. මහෞෂධ පඬිතුමා සතු ව තිබූ,

- ස්ථානෝචිත ප්‍රඥාවත්
- කාර්ය සංවිධානයත්

යුද්ධ ජයග්‍රහණය සඳහා යොදා ගත් ආකාරය උම්මග්ග ජාතකයේ විස්තර කෙරෙනුයේ පාඨක සිත් ඇද බැඳ ගන්නා ආකාරයෙනි.

නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

වීණා වාදනයේ මිහිරි බව කියා පෑමට,

- සුරඟන රැඟුමත්
- අවට රැස්වූවන්ගේ ස්වභාවයත්

උචිත සේ ගැළපීමට ගුත්තිල කතු හිමියන් දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

4.
- අතීත ශ්‍රී විභූතියත්
- අනාගත සමෘද්ධියත්

අපූර්ව ලෙස සංකලනය කිරීමට කවියා සමත් වී තිබීම 'දෑතේ කරගැට සිඹ සනසන්නට' කාව්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

- උචිත අවස්ථා යොදා ගැනීමත්
- සිද්ධි ගැළපීමත්

'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක සිත් ගැනීමට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. 'සිංහබාහු' යනු වත්මන් තරුණ පරපුරේ සිතුම් පැතුම් නියෝජනය කෙරෙන චරිතයකි. නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

6. කථා රසය උද්දීපනය වන අයුරින් සිද්ධි පෙළගැස්වීමේ දී කතුවරයා දක්වා ඇති කුසලතාව 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. 'ජාතික තොටිල්ල' කවිපෙළේ සාර්ථකත්වයට උපයුක්ත භාෂා ශෛලියේ සුලලිත බව හේතු වී ඇත. නිර්දිෂ්ට කවි පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

❊ ❊ ❊